**සී/ස නැට්වෙල්ත් සෙකියුරිටීස් සමාගමේ ගනුදෙනු පිළිබඳව වාර්තාව - 2022 හා 2023**

---

සී/ස නැට්වෙල්ත් සෙකියුරිටීස් සමාගමේ 2022 හා 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයන්හි මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සෑම විගණන කරනු ලබන අස්ථිත්වයක් විසින්ම එම අස්ථිත්වය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්වයක් සම්බන්ධයෙන් වූ පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්වවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්වයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**02. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දෙන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද 2022 සහ 2023 වර්ෂවල පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 වත්කම්, වගකීම්, ආදායම් හා වියදම්**

සමාගම විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **මූල්‍ය ප්‍රකාශන අයිතමය** | **වටිනාකම** |
|---|---|
| ------------------------- | රු.<br>---------- |
| <u>වත්කම්</u> | |
| මුළු වත්කම් | 1,286,466,371 |
| | |
| <u>ස්කන්ධය හා වගකීම්</u> | |
| ස්කන්ධය | 811,257,071 |
| මුළු බැරකම් | 475,209,300 |
| මුළු ස්කන්ධය හා බැරකම් | 1,286,466,371 |
| | |
| මුළු ආදායම | 61,545,048 |
| මුළු වියදම | 79,490,464 |
| අතිරික්තය / ( ඌණතාවය) බදු පෙර | (17,945,416) |

**03.** **සමාගම ඇවර කිරීම**

| | විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලෙහි පරිපාලිත සමාගමක් වන සී/ස නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම විසින් රු.200,000,070 ක (කොටස් 20,000,007 ක) මූලික ආයෝජනයක් සිදු කරමින් එම සමාගමෙහි පරිපාලිත සමාගමක් වශයෙන් සී/ස නැට්වෙල්ත් සෙකියුරිටීස් සමාගම 2003 ජූනි මස 23 දින ස්ථාපිත කර තිබුණි. 2021 දෙසැම්බර් 31 දින වන විට සී/ස නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම විසින් සී/ස නැට්වෙල්ත් සෙකියුරිටීස් සමාගමෙහි කොටස් 117,500,007 ක රු.1,175,000,070 ක් ආයෝජනය කර තිබුණි.<br><br>සමාගම විසින් 2012 - 2017 කාලපරිච්ඡේදය තුළ සුරැකුම්පත් ගනුදෙනු තුළින් ප්‍රමාණවත් ලාභ ලබා නොතිබුණු අතර සැලකිය යුතු අලාභයන් ලබා තිබුණි. තවද 2020 දෙසැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රාථමික ගනුදෙනු කිරීම සඳහා සමාගම වෙත ලබා දී තිබුණු අවසරය ඉවත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. මෙකී හේතු මත, 2021 මාර්තු 02 දිනැති අංක අමප/ 21/ 0269/ 313/ 012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් සමාගම ඇවර කිරීමට තීරණය කර තිබුණි. එසේ වුව ද 2024 අගෝස්තු 31 දින වන විටත් සමාගම ඇවර කිරීම සඳහා ඇවරකරුවෙකු පත් කර නොතිබුණි. | සමාගම විසින් මූල්‍ය අවභාවිතය සම්බන්ධ නඩු 2 ක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පවරා ඇති බැවින් එම නඩු අවසන් වන තෙක් සමාගම් ඇවර කිරීම ප්‍රමාද වී ඇත. | ඇවරකරුවෙකු පත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පුද්ගලික සමාගම් 2ක් විසින් සමාගමට එරෙහිව නඩු පවරා තිබුණු අතර, එම නඩු තීන්දු අනුව සමාගම් දෙක සඳහා රු.මිලියන 95ක මුදලක් 2021 ජූනි මස 29 දින ද, රු. මිලියන 325 ක් 2022 ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවල දී නිරවුල් කර තිබුණි. තක්සේරු වර්ෂ 2008/2009 සිට 2015/2016 දක්වා ආදායම් බදු, ඊට අදාළ දඩ මුදල් හා ගෙවිය යුතු වූ එකතු කළ අගය මත බදු වශයෙන් එකතුව රු. මිලියන 461.2 ක් සමාගම විසින් 2023 වර්ෂයේ දී ගෙවා තිබුණි. එසේ වුව ද සමාගම ඇවර කිරීම සඳහා සමාගම් පනත ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාර ඇවර කිරීමේ ක්‍රියාවලිය අනුගමනය කළ යුතුය. |

**04. ගිණුම් පොත්පත් හා ලේඛන ඉදිරිපත් නොකිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගමේ 2023 වර්ෂයට අදාල අධ්‍යක්ෂ මණ්ඩල තීරණ, බැංකු ප්‍රකාශන, බැංකු සැසඳුම් ප්‍රකාශන, මුදල් පොත, ගෙවීම් වවුචර්, ලදුපත්, ආයෝජන පිළිබඳ විස්තර සහ අධිකරණ ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තා, ගණකාධිකාරී සමාගමක් වන අමරසේකර සහ සමාගම විසින් සිදු කරන අතර සියලුම වාර්තා එම ගණකාධිකාරී සමාගමේ ඇති අතර එම සමාගම වෙත ගොස් අදාල පරීක්ෂාවන් සිදු කළ හැකිවේ. | අවසන් මූල්‍ය ප්‍රකාශ හා ගිණුම් වාර්තා සකස් කර ඉදිරිපත් කිරීමේ වගකීම කළමනාකරණය සතු වේ. නියමිත පරිදි මූල්‍ය වාර්තා ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් කළමනාකරණයට විරුද්ධව කටයුතු කළ යුතුය. |